## *බළන්ගොඩ නගර සභා රැස්වීම් වාර්තාව*

ස්ථානය : බළන්ගොඩ නගර සභා රැස්වීම් ශාලාව.

දිනය : 2012-04-30

වේලාව : පෙ.ව.09.00

බළන්ගොඩ නගර සභාවේ ගරු සභාපති, ඩබ්.එම්.එන්.ජී.වීරසිංහ මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් සභාවේ කටයුතු පවත්වන ලදී.

**සහභාගීත්වය:-**

| | |
|---|---|
| 01. ගරු සභාපති, | ඩබ්.එම්.එන්.ජී.වීරසිංහ මැතිතුමා |
| 02. ගරු උපසභාපති | ඩබ්.ඒ.වසන්ත පුෂ්පකුමාර ගුණරත්න මැතිතුමා |
| 03. ගරු නාගරික මන්ත්‍රී | ධර්මසේන සමරසිංහ මැතිතුමා |
| 04. ගරු නාගරික මන්ත්‍රී | ඊ.ඒ.ජේ.ප්‍රේමකුමාර මැතිතුමා |
| 05. ගරු නාගරික මන්ත්‍රී | එම්.ටී.එම්. රූමි මැතිතුමා |
| 06. ගරු නාගරික මන්ත්‍රී | එම්. නිමල් කරුණාරත්න මැතිතුමා |
| 07.ගරු නාගරික මන්ත්‍රී | ඒ.අසංක නිල්මිණී විජේසිංහ මැතිතුමා |
| 08. ගරු නාගරික මන්ත්‍රී | චමික ජයමිණ වැවේගෙදර මැතිතුමා |
| 09. ගරු නාගරික මන්ත්‍රී | එම්.ජේ.මලීක්ෂා මැතිතුමා |

**නිලධාරී සහභාගීත්වය:-**

01. එම්.එච්.සීලවතී මිය ලේකම්

(01) **ආගම සිහිකිරිම:**

රැස්වීමට පැමිණ සිටි සියළු දෙනා තම තමන්ගේ ආගම සිහිකිරීමෙන් අනතුරුව රැස්වීමේ කටයුතු ආරම්භ කරන ලදි.

(02) **ගරු සභාපතිතුමා විසින් කරනු ලබන නිවේදන :**

ගරු සභාපතිතුමා කථාකරමින්, අද නි පවත්වනු ලබන්නේ 2012 වර්ෂයේ අප්‍රේල් මාසයට අදාළ මහා සභා රැස්වීම බවත්, ඒ සඳහා සහභාගීවීමට පැමිණ සිටින ගරු උපසභාපතිතුමා, ගරු නාගරික මන්ත්‍රීතුමන්ලා, ලේකම්තුමිය සහ පුවත්පත් කලාවේදී මහතුන් ඉතා ගෞරවයෙන් යුතුව පිළිගන්නා බැව් පැවසීය.

ඉන් අනතුරුව අදහස් දැක් වූ ගරු සභාපතිතුමා, වසර ගණනාවක් පැවති කුරිරු යුද්ධය නිමකර සැම දෙනාටම සමඟියෙන් සතුටින් ජීවත්වීමට හැකි පරිසරය අතිගරු ජනාධිපතිතුමා විසින් නිර්මාණය කල නිසා 2012 සිංහල හා හින්දු අලුත් අවුරුද්ද , සැම දෙනාටම සතුටින් හා සාමයෙන් යුතුව ගත කිරීමට හැකි වූ බැව් පවසමින් සියළු දෙනාටම සුභ අලුත් අවුරුද්දක් වේවා යි ප්‍රාර්ථනය කරන ලදී.

මධ්‍යම පරිසර අධිකාරියේ පසුභාවිත ප්ලාස්ටික් අපද්‍රව්‍ය කළමණාකරන ජාතික ව්‍යාපෘතියේ මුල්‍යාධාර මත බැංකියවත්ත සන අපද්‍රව්‍ය මධ්‍යස්ථානයේ ඉදිකරන ලද ප්ලාස්ටික් ප්‍රතිචක්‍රීයකරණ මධ්‍යස්ථානය ගරු පරිසර අමාත්‍යතුමන් අතින් ලබන මස 15 වන දින විවෘත කිරීමට බලාපොරොත්තු වන බැව් දැන්වීය.

කම්කරු දිනය නිමිතිකරගෙන " එකම රටක් " යන තේමා පාඨය මුල්කරගෙන මෙවර එක්සත් ජනතා නිදහස් සංධානයේ කම්කරු දින පෙළපාළිය මැයි මස 01 වෙනි දින කොළඹ දී පැවැත්වීමට අවශ්‍ය කටයුතු සංවිධානය කර ඇති බැවින්, ඒ සදහා සහභාගීවන ලෙස ගරු මන්ත්‍රීවරුන්ට ආරාධනා කරන ලදී.

වෙසක් පුන්පොහොය නිමිතිකරගෙන නගරය ආලෝක කිරීම, සැරසීම ආදිය සිදුකිරීමට බලාපොරොත්තු වන බැවින්, ඒ සඳහා සහය දක්වන ලෙස ඉල්ලා සිටිමින් සභාවේ ඉදිරි කටයුතු ආරම්භ කරන ලදී.

(03) **2012.03.29 වන දින පැවති මහා සභා රැස්වීමේ වාර්තාව සත්‍ය වාර්තාවක් බවට සභා සම්මත කිරීම**

පසුගිය මහා සභා රැස්වීමේ වාර්තාව සත්‍ය වාර්තාවක් බවට ගරු නාගරික මන්ත්‍රී එම්.නිමල් කරුණාරත්න මැතිතුමා විසින් යෝජනා කල අතර, එම යෝජනාව ගරු උපසභාපතිතුමන් ස්ථිර කරන ලදී. ඒ අනුව පසුගිය මහා සභා රැස්වීමේ වාර්තාව සභා සම්මත විය.

(04) **පසුගිය වාර්තාව සමාලෝචනය කිරීම**

වාර්තාව සමාලෝචනය කිරීමක් සිදුනොවීය.

05. **පසුගිය සභාවේ දී ගනු ලැබු තීරණ ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය ඉදිරිපත් කිරීම** :

පසුගිය සභාවේ දී ගනු ලැබු තීරණයන් හි ප්‍රගතිය ඉදිරිපත් කරන ලදී.

06. **සභාවට ලැබී ඇති ලිපි/පෙත්සම්/පැමිණිලි ආදිය ඉදිරිපත් කිරීම :**

06:01 **රථවාහන නැවතුම් ගාස්තු අඩුකරගැනීම :**

ඉහත සඳහන් කරුණට අදාළව බළන්ගොඩ , සේනක පෙදෙස යන ලිපිනයේ පදිංචි තනුජා කුමාරි වීරපුර යන විසින් එවා ඇති 2012-04-05 දිනැති ලිපිය සභාගත කරන ලදී.

2012-03-31 දින බළන්ගොඩ නගරයට අතිගරු ජනාධිපතිතුමාගේ පැමිණීම නිමිත්තෙන් එදින දවස පුරා නගරයේ රථවාහන නතර කිරීමට පොලිසිය විසින් අවසර ලබා ලබානොදුන් බැවින්, රථ වාහන නැවතුම් ගාස්තු අයකරගැනීමට නොහැකි වු නිසා එදිනට ගාස්තු අයකිරීමෙන් නිදහස් කරදෙන ලෙස ඉල්ලා තිබිණ.

2012-03-31 වන දින නගරයේ රථවාහන නවතා තැබීමට අවසර ලබානොදුන් නිසා එදිනට ගාස්තු අයකිරීමෙන් නිදහස් කිරීමට සභාවේ අනුමැතිය ලබාදෙන ලදී.

06:02 **පළාත් පාලන ආයතන මහජන නියෝජිතයින්ගේ රාජකාරි ගමන් බිමන් සඳහා යොදා ගන්නා යතුරු පැදි සඳහා ඉන්ධන දීමනාවක් ලබාගැනීම :**

ඉහත කරුණට අදාළව පළාත් පාලන කොමසාරිස් විසින් එවා ඇති 2012-04-11 දිනැති ලිපිය ගරු සභාවේ දැනගැනීම සඳහා සභාගත කරන ලදී.

2012-04-04 දිනැති පළාත් පාලන කොමසාරිස් චකලේඛ අංකඃ 03/2012 කෙරෙහි අවධානය යොමුකර එකී චක්‍රලේඛ විධි විධාන පහත පරිදි සංශෝධනය කරනු ලබන බැව් එමගින් දන්වා තිබිණ.

- 2012-04-01 දින සිට ක්‍රියාත්මක වන පරිදි පළාත් පාලන ආයතන මහජන නියෝජිතයින්ගේ රාජකාරී ගමන් බිමන් සඳහා මාසිකව රු.3000/- ක ඉන්ධන දීමනාවක් ලබාදීමට අනුමැතිය ලැබී ඇත.

- ඒ අනුව පහත සඳහන් කරුණු වලට යටත්ව මෙම දීමනාව ලබාගැනීම සඳහා ඉල්ලුම් කරන සෑම පළාත් පාලන ආයතන මහජන නියෝජිතයෙකුම දැනටමත් තමන් සතුව ඇති

- පෞද්ගලික යතුරු පැදිය හෝ අනුමත ණය මුදලින් ලබාගන්නා යතුරු පැදිය තමාගේ නමින් ලියාපදිංචි වී තිබෙන බවට නාගරික කොමසාරිස්/ලේකම් විසින් තහවුරු කළ යුතුය.

- යතුරු පැදියට අදාල ආදායම් බලපත්‍රය/රක්ෂණ සහතිකය වලංගුව පවතින බව තහවුරු කළ යුතුය.
- වෙනත් පුද්ගලයෙකු සතු යතුරු පැදියක් තමාගේ නමින් නීත්‍යානුකූලව පවරාගෙන ඇත්නම් ඒ සඳහා ද මෙම දීමනාව ලබාගත හැකිය. දීමනාව මාසික ඉන්ධන දීමනාවක් ලෙසට සභිකයින් සඳහා ගෙවීමට කටයුතු කල යුතුය.

- මෙම ඉන්ධන දීමනාව ගෙවීමට පෙර නාගරික ලේකම් විසින් තම පළාත් පාලන ආයතනයේ මහජන නියෝජිතයින් විසින් ඉදිරිපත් කර ඇති යතුරුපැදි හිමිකම් සහතික වල නිවැරදිතාවය තහවුරු කර අනුමැතිය සඳහා යොමුකළ යුතු අතර, ඒ අනුව අදාල අනුමැතිය ලැබීමෙන් පසු එම දීමනාව ගෙවීමට කටයුතු කල යුතුය.

- ඉන්ධන දීමනාව ගෙවීමට පෙර අදාල ඉන්ධන සඳහා බිල්පත් ලබාගෙන එය රු.3000/- ට වඩා නොඉක්මවන බව තහවුරු කරගත යුතුය.

06:03 **ජාතික රණවිරු දිනය - සබරගමුව පළාත් උත්සවය**

ඉහත සඳහන් කරුණට අදාළව පළාත් පාලන කොමසාරිස් විසින් එවා ඇති ලිපියක් සභාගත කරන ලදී.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ජනාධිපති සේනාධිනායක අතිගරු මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ අභීත නායකත්වය හා ත්‍රිවිධ හමුදාපතිවරුන්, පොලිස්පතිතුමන් ඇතුළු රණවිරුවන්ගේ කැපවීම මත දේශයේ විරුවන්ගේ ජීවිත පරිත්‍යාගයෙන් අප මාතෘ භූමියේ සාමය හා නිදහස යළි ස්ථාපිත කරවීම සදා උපහාර පිදිය යුතු ජාතික මෙහෙවරක් වන බැවින් , අප රට වෙනුවෙන් ජීවිත පූජා කල රණබිමේ දී ආබාධිත වූ අභීත රණවිරුවන්ට ද , රණවිරු පවුල්වල සාමාජිකයින් වෙත ද උපහාර පිදීමේ උත්සවයට සමගාමීව සබරගමුව පළාත් උත්සවය 2012.05.16 දිනට යෙදී ඇති බවද මෙම උත්සවය සාර්ථක කරගැනීම සඳහා රු.2,000/- ක චෙක්පතක් සභාවෙන් එවන ලෙස දන්වා තිබිණ.

ඉහත සඳහන් මුදල ලබාදීමට සභාවේ අනුමැතිය ලබාදෙන ලදී.

06:04 **තක්සේරු ලේඛනයේ සුළු නිවැරදි කිරීම් :**

ඉහත කරුණට අදාළව ඉදිරිපත් කර ඇති ලිපියක් සභාගත කරන ලදී.

මෙවර නව තක්සේරුවේ දී අළුතින් නගර සභා බල ප්‍රදේශයට එක් වූ දේපලවල සමහර අයගේ නම් ලේඛනගත වී නැති අතර, තවත් සමහර අයගේ නම් වැරදි ලෙස ලේඛනගතවී ඇත. මෙම අයවලුන්ගේ අයිතිවාසිකම් නිවැරදිව ලේඛණගතකර ගැනීමට විරෝධතා පරීක්ෂණයට ලිපි ඉදිරිපත් කර ඇති

නමුත් විරෝධතා පරීක්ෂණයේ දී ඒවා නිවැරදි කල නොහැකි බව පවසා ගාස්තු අයනොකර අදාල විස්තර කාර්යාලයට ලබාගෙන සකස් කරන ලෙස තක්සේරු නිලධාරීන් උපදෙස් ලබා දී ඇත.

එබැවින්, අළුතින් නගර සභා බලප්‍රදේශයට එක් වූ දේපළවල පමණක් තක්සේරු ලේඛනයේ ඇති සුළු සුළු නිවැරදි කිරීම් ගාස්තු අය නොකර කිරීම සුදුසු බැවින්, සභා තීරණයක් ගැනීම සුදුසු බැව් එමගින් දන්වා තිබිණ.

මුදල් අයනොකර අදාල සංශෝධන සිදුකිරීමට සභාවේ අනුමැතිය ලබාදෙන ලදී.

06:05 **කඩ කුලී ගෙවීම පැහැර හැරීම :**

බළන්ගොඩ නව මහජන පොළ භූමියේ අංක 10 දරණ කඩ කාමරය බදුගෙන ඇති ආර්.කේ.ජයසුන්දර යන අය එම කඩ කාමරය බදු ගැනීමෙන් පසු මෙම සභාවට ගෙවා කුලී ගෙවා ඇත්තේ 2011 ජනවාරී මස පමණක් බවත්, පොදු වෙළඳසැල කඩ කාමර අංකඃ 13 දරණ කඩ කාමරය මිල්කා ෂාලිමා මහත්මිය විසින් බදුගෙන තිබුණ අතර, එම කඩ කාමරයේ මේවන විට රු.30000/- ක හිඟ මුදලක් පවතින අතර, එම මුදල ගෙවන ලෙස දැනුවත් කර ඇති නමුත්, මේ දක්වා ගෙවීමට කටයුතු කර නොමැති බැවින්, මේ සම්බන්ධව ගත යුතු ඉදිරි ක්‍රියාමාර්ගයන් සම්බන්ධව උපදෙස් ලබාදෙන ලෙස ඉල්ලා තිබිණ.

හිඟ මුදල් ගෙවන ලෙස අදාල අය වෙත දැණුම්දීමටත්, නොගෙවන්නේ නම්, කඩ කාමර ආපසු සභාවට පවරා ගැනීමටත් සභාවේ අනුමැතිය ලබාදෙන ලදී.

06:06 **2012 වර්ෂයේ විශේෂ අවුරුදුපොළ ආදායම :**

2012 වර්ෂයේ සිංහල හා හින්දු අළුත්අවුරුද්ද වෙනුවෙන් පවත්වන ලද විශේෂ අවුරුදුපොළ සඳහා රු.62860/ක මුදලක් එකතු කර ලබා දී ඇති බවත්, නමුත් 2011 වර්ෂයේ අවුරුදුපොළ ආදායම රු.77320/- ක් වූ අතර, මෙම වර්ෂයේ ආදායම අඩු වී ඇති බැව් සභාවේ දැනගැනීම සඳහා වාර්තා කර තිබුණි.

06:07 **අංකඃ 28 කඩ කාමරය සඳහා ඔප්පුව සකස් කිරීම :**

බළන්ගොඩ බස්නැවතුම්පළ අංකඃ සී 28 දරණ කඩ කාමරය බදු ඔප්පුව එල්.ටී.එච්.හේමචන්ද්‍ර නමින් සකස් කරදෙන ලෙස ඉල්ලා ඉදිරිපත් කර ඇති ලිපියක් සභාගත කරන ලදී.

ඉහත සඳහන් අයගේ නමින් බදු ඔප්පුව සකස් කරදීමට සභාවේ අනුමැතිය ලබාදෙන ලදී.

06:08 **බළන්ගොඩ බස්නැවතුම්පළ කාර්යාල කාමරය බදුදීම :**

ඉහත කරුණට අදාළව වෛද්‍ය ඩී.සී.එස්.ද සිල්වා මහතා විසින් ඉදිරිපත් කර ඇති ලිපියක් සභාගත කරන ලදී.

මේ සම්බන්ධව සලකා බැලූ සභාව, එකතු කල අගය මත බදු මුදලත් සමඟ රු.2000/- ක් මාසිකව අය කිරීමටත්, මාස 03 ක කුළිය තැන්පත් මුදල් ගෙන ලෙසත් දන්වා යැවීමට තීරණය කරන ලදී.

06:09 **විදේශ සංචාරයක් සඳහා නිවාඩු අනුමත කරගැනීම :**

යුනෙස්කෝ සමුළුව සඳහා කොරියානු රාජ්‍යයට යාම සඳහා ආරාධනාවක් ලැබී ඇති බැවින්, ඒ සඳහා මැයි මස 14 දින සිට 18 වන දින දක්වා නිවාඩු අනුමත කරදෙන ලෙස ඉල්ලා, ගරු උපසභාපති, ඩබ්.ඒ.වසන්ත පුෂ්පකුමාර ගුණරත්න මැතිතුමා විසින් ඉදිරිපත් කර ඇති ලිපියක් සභාගත කරන ලදී.

අදාල කාල සීමාවට නිවාඩු අනුමත කල සභාව, මේ සඳහා පළාත් පාලන කොමසාරිස් වෙතින් අනුමැතිය ලබාගැනීමට තීරණය කරන ලදී.

07. **මුදල් ගෙවීම් අනුමත කිරීම ( රු.10000/- ට වැඩි ගෙවීම්)**

2012.02.21 දින සිට 2012.03.10 දක්වා රු.10000/- ට වැඩි ගෙවීම් පිළිබඳ විස්තරයක් සභාවට ඉදිරිපත් කරන ලදී.

| දිනය | විස්තරය | ව.අ. | චෙක්පත් අංකය | මුදල |
|---|---|---|---|---|
| 2012-02-21 | බී.ගුණරත්න<br>2012-02-01 දින සිට 2012-02-15 දින දක්වා නගරයේ කැළි කසල එකතු කිරීම හා ප්‍රවාහනය | 82 | 280590 | 117000.00 |
| | සභාපති, කිරිදිගල ග්‍රාම සංවර්ධන සමිතිය,<br>සී/සී දෙමළ මහා විද්‍යාලයේ පසුපස මාර්ගය කොන්ක්‍රීට් කුට්ටි ඇතිරීම ii අදියර කර්මාන්තයේ 10% රැදවුම් හා ගිවිසුම් ඇප තැන්පත් ආපසු ගෙවීම | 83 | 280591 | 74982.51 |
| | ජී.ලීල් වික්‍රමරත්න<br>තානායම නව දෙමහල් ගොඩනැගිල්ලේ පොළොව කොන්ක්‍රීට් කිරීම , තානායම බෝගස අසල වේදිකාව කොන්ක්‍රීට් කිරීම, තානායමේ දෙමහල් ගොඩනැගිල්ලට යාබද පිහිටි පොල්මුල ගලවා ඉවත් කිරීම සඳහා මුදල් යෙදවීම | 84 | 280591 | 21823.00 |
| | ඩබ්.පී.ධනුෂ්ක සංජීව පතිරණ<br>දැයට කිරුළ ප්‍රදර්ශනය සඳහා ගිය පිරිස වෙනුවෙන් ලබාගත් නිවසේ කුළිය | 85 | 280593 | 40000.00 |
| | එන්.ඩී.ගුණතුංග<br>තානායමේ ඉදිකිරීම් කටයුතු,ප්‍රිමික්ස් නිෂ්පාදනය සඳහා වැලි කියුබ් 10 ක් ලබාගැනීම | 86 | 280596 | 60000.00 |

| | | | | |
|---|---|---|---|---|
| | අජිත් මෝටර්ස්<br>ජේ.සී.බී.යන්ත්‍රයේ අලුත්වැඩියාවන් වෙනුවෙන් මුදල් ගෙවීම | 89 | 286453 | 60000.00 |
| | සභාපති, තුඹගොඩ ශක්ති ග්‍රාම සංවර්ධන සමිතිය<br>කුමාරගම ග්‍රාම නිලධාරී වසමේ මඩවලවත්ත මාර්ගය 1 අදියර කොන්ක්‍රීට් කුට්ටි ඇතිරීම කර්මාන්තයේ රැඳවුම් හා කොන්ත්‍රාත් ගිවිසුම් ඇප තැන්පත් ආපසු ගෙවීම | 91 | 286482 | 70429.19 |
| 2012-02-27 | සාමාන්‍යාධිකාරී , ඉඹුල්පේ විවිධ සේවා සමුපකාර සමිතිය<br>2011-12-18 දින සිට 2011-12-24 දින දක්වා ඉන්ධන බිල්පත පියවීම | 92 | 286484 | 67499.05 |
| | සාමාන්‍යාධිකාරී , ඉඹුල්පේ විවිධ සේවා සමුපකාර සමිතිය<br>2011-12-22 දින සිට 2011-12-29 දක්වා ඉන්ධන බිල්පත පියවීම | 93 | 286484 | 81132.45 |
| | එච්.ජී.එන්.හෙට්ටිආරච්චි<br>නගර සභාවේ පින්තූර කිහිපයක් රාමු කිරීම, 2011 වර්ෂයේ වැඩ සටහන් වලට අදාල පින්තූර ඇතුළත් ඇල්බමයක් සැකසීම | 95 | 286486 | 18215.00 |
| | එච්.එල්.ඩබ්.ඉන්ජිනියරින් සර්විසස්<br>226-7521 වාහනයට අමතර කොටස් ලබාගැනීම | 97 | 286488 | 10350.00 |
| | ජෝති ස්ටෝර්ස්<br>2012 වර්ෂයේ කළමණාකරන දිනපොත් හා සුදු ලියුම් කවර ලබාගැනීම | 99 | 286490 | 10025.00 |
| | ජේ.ජී.පී.වික්‍රමසිංහ<br>මහජන පුස්තකාලයට හා නව කියවීම් ශාලාවට 2012 ජනවාරි මාසයේ පුවත්පත් හා සගරා සැපයීම | 101 | 286492 | 18065.00 |
| | හර්ෂන කලර් සෙන්ටර්<br>තානායමේ දෙමහල් ගොඩනැගිල්ලේ තීන්ත ආලේපය සඳහා අවශ්‍ය ද්‍රව්‍ය ලබාගැනීම | 102 | 26492 | 105991.00 |
| 2012-02-27 | දේව් ට්‍රැක්ටර්ස් පුද්ගලික සමාගම<br>ජී.කේ.6244 හා ජී.කේ.1483 ට්‍රැක්ටර් රථ සඳහා අමතර කොටස් ලබාගැනීම | 107-1 | 286498 | 46674.00 |
| | ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය<br>මස්සැන්න මාර්ගය ජල නල දිර්ඝ කිරීම වෙනුවෙන් පොදු ජල නල මාර්ගය සඳහා වු ඇස්තමේන්තුව වෙනුවෙන් ගෙවීම | 108 | 286499 | 124295.15 |
| 2012-02-29 | සාමාන්‍යාධිකාරී ඉඹුල්පේ විවිධ සේවා සමුපකාර සමිතිය<br>2012-01-04 සිට 2012-01-26 දක්වා ඉන්ධන බිල්පත පියවීම | 109 | 286501 | 105787.10 |
| | සාමාන්‍යාධිකාරී ඉඹුල්පේ විවිධ සේවා සමුපකාර සමිතිය<br>2012-01-04 දින සිට 2012-01-31 දක්වා ඉන්ධන බිල්පත පියවීම | 110 | 286501 | 60029.69 |
| | සාමාන්‍යාධිකාරී ඉඹුල්පේ විවිධ සේවා සමුපකාර සමිතිය<br>2012-01-10 දින සිට 2012-01-23 දක්වා ඉන්ධන | 111 | 286501 | 76586.32 |

| | | | | |
|---|---|---|---|---|
| | බිල්පත පියවීම | | | |
| | ශ්‍රී ලංකා ටෙලිකොම් ලිමිටඩ්<br>2011 දෙසැම්බර් මස දුරකථන බිල්පත<br>අංකය මුදල<br>2287275 7070.28<br>2287153 924.28<br>2286596 4154.22<br>2288737 7306.79<br>E-mail 244.90 | 112 | 286501 | 67385.50 |
| | ශ්‍රී ලංකා ටෙලිකොම් ලිමිටඩ්<br>2011 දෙසැම්බර් මස දුරකථන බිල්පත<br>2287275<br>2287153<br>2286596<br>2288737<br>E-mail | 114 | 286503 | 19700.47 |
| | ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය,<br>2012 ජනවාරි මස ජල බිල්පත පියවීම<br>පොදු වෙළඳසැල/<br>මහජනපොළ | 119 | 286506 | 29209.60 |
| | රිෂානා සර්විස් ස්ටේෂන්<br>ජේ.සී.බී. යන්ත්‍රය පූර්ණ සේවා කිරීම | 122 | 286507 | 23296.00 |
| 2012-03-01 | ආර්.සූරසේන<br>බළන්ගොඩ තානායම දෙමහල් ගොඩනැගිල්ලේ උඩුමහල සඳහා ගඩොල් ලබාගැනීම | 01 | 286500 | 56000.00 |
| | ශ්‍රී ලංකා ටෙලිකොම් ලිමිටඩ්<br>ගරු නාගරික මන්ත්‍රීතුමන්ලාගේ දුරකථන බිල්පත් පියවීම03<br>2287024 - 2012 ජනවාරි<br>2287022 - 2011 දෙසැම්බර්<br>2288565 - 2011 දෙසැම්බර්<br>045-3452932- 2011 දෙසැම්බර්<br>2288206- 2011 දෙසැම්බර් | 03 | 286509 | 14624.25 |
| | එල්.ඊ.සී.සී.මෙටල් ක්‍රෂර්<br>නගර සභාව සඳහා අවශ්‍ය 1/2 ගල් ලබාගැනීම | 04 | 286510 | 15000.00 |
| 2012-03-06 | බී.ගුණරත්න<br>2012-02-16 දින සිට 2012-02-29 දක්වා නගරයේ කැළි කසළ එකතු කිරීම | 05 | 286511 | 117000.00 |
| 2012-03-08 | සභාපති, තුඹගොඩ ශක්ති ග්‍රාම සංවර්ධන සමිතිය<br>බැංකියවත්ත පසුභාවිත ප්ලාස්ටික් ඝන අපද්‍රව්‍ය ප්‍රතිචක්‍රීයකරණ මධ්‍යස්ථානයේ ඉතිරි වැඩ කොටස් නිමකිරීම සඳහා 20% අත්තිකාරම් මුදලක් ලබාගැනීම | 06 | 286516 | 107377.00 |
| | සත්‍යා මෝටර්ස්<br>එන්.ජී.5124 වැන් රථයට දොර සහ ලයිට් ලබාගැනීම | 11 | 286529 | 125000.00 |
| | එල්.අනුර<br>බැංකියවත්ත ප්ලාස්ටික් ප්‍රතිචක්‍රීකරණ මධ්‍යස්ථානයේ තීන්ත ආලේප කිරීම වෙනුවෙන් අත්තිකාරම් මුදලක් ලබාගැනීම | 12 | 286530 | 25000.00 |

| | | | | |
|---|---|---|---|---|
| | ජාන් කම්පියුටර්ස් සර්විසස් වරිපනම් විෂයට අදාල පරිගණකය සඳහා CPU එකක් , කලර් ප්‍රින්ටරයට කාට්රිජ් 04, HP 12 A ටෝනර් 02 සදහා මුදල් ගෙවීම | 13 | 286531 | 58400.00 |
| | ජාන් කම්පියුටර්ස් සර්විසස් කර්යාලය සඳහා ගෙනෙන ලද පරිගණක, ජාලගත කිරීම | 14 | 286531 | 20250.00 |
| | සිලෝන් පෙට්‍රෝලියම් කෝපරේෂන් ලීටර් 180 තාර බැරල් 35 ලබාගැනීම | 16 | 286533 | 576450.00 |
| 2012-03-14 | යුනි බ්‍රවුන් ප්‍රයිවට් ලිමිටඩ් තානායමේ පොල් අතු සෙවිල් කල ගොඩනැගිල්ල සඳහා ටයිල් ලබාගැනීම | 17 | 286534 | 21250.00 |
| 2012-02-21 දින සිට 2012-03-15 දින දක්වා රු.10000/- ට වැඩි ගෙවීම් - තානායම් ගිණුම | | | | |
| 2012-02-21 | ජගත් එන්ටර්ප්‍රයිසස් තානායම සඳහා ගෑස් ලබාගැනීම | 71 | 280270 | 12374.00 |
| 2012-02-24 | ඉන්දික එරික් සිසිල් තානායම සඳහා එළවළු ලබාගැනීම | 74 | 280275 | 11700.00 |
| | දීපානී ගොවි සේවා තානායම සඳහා කුකුළු මස් ලබාගැනීම | 76 | 280274 | 16687.00 |
| 2012-02-29 | ජාතික ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලය 2012 ජනවාරි මස ජල බිල්පත පියවීම - තානායම | 78 | 280278 | 16794.50 |
| 2012-03-01 | ඩිස්ටිලරීස් කම්පැණි ඔෆ් ශ්‍රී ලංකා පී.එල්.සී. තානායම සඳහා රටබීම ලබාගැනීම | 01 | 280279 | 136853.88 |
| 2012-03-08 | ජගත් එන්ටර්ප්‍රයිසස් තානායම සඳහා ගෑස් ලබාගැනීම | 05 | 280282 | 10748.00 |
| 2012-03-15 | ලංකා විදුලිබල මණ්ඩලය 2012 පෙබරවාරි මස විදුලිය බිල්පත තානායම/ තානායම් නිල නිවස | 07 | 280287 | 38548.90 |
| | ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය, 2012 පෙබරවාරි මස ජල බිල්පත - තානායම | 08 | 280288 | 12069.50 |
| | හුස්නාස් තානායම සඳහා ඇද ඇතිරිලි 42 ලබාගැනීම | 11 | 280291 | 15750.00 |
| 2012-02-29 දින සිට 2012-03-15 දින දක්වා රු.10000/- ට වැඩි ගෙවීම් - ලංකා බැංකු ගිණුම | | | | |
| 2012-02-29 | ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය 2012 ජනවාරි මස ජල බිල්පත පියවීම - නව බස්නැවතුම්පල | 02 | 000162 | 70313.10 |
| | ඩබ්.දයාරත්න මහජනපොළ ඉඩම පිළිබඳ 3089 නඩුවේ 2012-02-13 වන දින පෙනී සිටීම වෙනුවන් නීතීඥ ගාස්තු ගෙවීම | 02 | 000164 | 50000.00 |
| | සභාපති, බළන්ගොඩ නගර සභාව ලංකා බැංකු ගිණුමෙන් පොදු ගිණුමට මුදල් මාරු කිරීම | 03 | 000165 | 1500000.00 |

මෙම මුදල් ගෙවීම් සියල්ල සභාව විසින් අනුමත කරන ලදී.

ගම නැගුම ;

08. **සභාවට ලැබී ඇති ඇස්තමේන්තු ඉදිරිපත් කිරීම :**

පහත සඳහන් ඇස්තමේන්තු සභා අනුමැතියට ඉදිරිපත් කරන ලදී.

08:01 බළන්ගොඩ ප්‍රජා ශාලාව ඉදිකිරීම රු. 1357312.10

08:02 නාගරික ළමා උද්‍යානය ඉදිකිරීම රු. 1225580.20

08:03 රිෂානා සර්විස් අසලින් ඇති ඉහළ මාර්ගය
බැම් බැඳ කොන්ක්‍රීට් කර සංවර්දනය කිරීම රු. 1225490.20

08:04 කුමාරගම පිරිවෙන මාර්ගයේ කාණු පද්ධතිය හා
මාර්ගය ප්‍රතිසංස්කරණය කිරීම රු. 1225490.20

08:05 කිරිඳිගල කලුඇල්ල කැලේ මාර්ගය ප්‍රතිසංස්කරණය
කිරීම රු.1225490.20

08:06 දෙහිගස්තලාව පල්ලිය අසල සිට මහවත්ත මාර්ගය
ප්‍රතිසංස්කරණය කිරීම රු.1225490.19

ඉහත සඳහන් ඇස්තමේන්තු අනුමත කල සභාව , මෙම කර්මාන්තයන් පහත සදහන් සමිතිය වෙත පවරා ඉටුකරගැනීමට සභාවේ අනුමැතිය ලබාදෙන ලදී.

01. අංකඃ 08:01 සභාව මගින් ඍජු ශ්‍රමයෙන් මගින්
02. අංකඃ 08:02 අලුත ගෙදර ග්‍රාම සංවර්ධන සමිතිය
03. අංකඃ 08:03 තුඹගොඩ ශක්ති ග්‍රාම සංවර්ධනය සමිතිය
04. අංකඃ 08:04 තුඹගොඩ ශක්ති ග්‍රාම සංවර්ධනය සමිතිය
05. අංකඃ 08: 05 කිරිඳිගල ග්‍රාම සංවර්ධන සමිතිය
06. අංකඃ 08:06 තුඹගොඩ ශක්ති ග්‍රාම සංවර්ධන සමිතිය

සභා අරමුදල් ;

පහත සදහන් කර්මාන්තයන් හි ඇස්තමේන්තු අනුමත කල සභාව, මෙම කර්මාන්තයන් පහත දැක්වෙන අනුමත සමිති වෙත පවරා ඉටුකරගැනීමට අනුමැතිය ලබාදෙන ලදී.

| අනු අංකය | ඇස්තමේන්තුවේ නම | ඇස්තමේන්තු මුදල | අනුමත සමිතිය |
|---|---|---|---|
| 01 | කුමාරගම මාර්ගයේ මඩවල කොටස කොනක්‍රීට් කිරීම | රු. 125000/- | |
| 02 | ගොරොක්ගහමඩ කිරිමණ්ඩල මාවත කොටසක් කොන්ක්‍රීට් කිරීම | රු.125000/- | |
| 03 | බැංකියවත්ත පසුභාවිත ප්ලාස්ටික් ඝන අපද්‍රව්‍ය කළමණාකරණ මධ්‍යස්ථානයේ ජල ටැංකි හා පොම්පාගාරය ඉදිකිරීම | රු.266179.95 | තුඹගොඩ ශක්ති ග්‍රාම |

| | | | |
|---|---|---|---|
| 04 | බැංකියවත්ත පසුභාවිත ප්ලාස්ටික් ඝන අපද්‍රව්‍ය මධ්‍යස්ථානයේ ඉතිරි වැඩ නිමකිරීම | රු.73717.23 | සංවර්ධන සමිතිය |
| 05 | බැංකියවත්ත පසුභාවිත ප්ලාස්ටික් ඝන අපද්‍රව්‍ය කළමනාකරණ ඒකකයේ ඉතිරි වැඩ නිමකිරීම ( ඒකක දෙකකින් යුතු වැසිකිළි පද්ධතිය ඉදිකිරීම ) | රු.316778.39 | |

09. **ටෙන්ඩර් මිළ ගණන් සලකා බැලීම :**

09:01 ජී.කේ.1483 ට්‍රැක්ටරයට බැටරියක් ලබාගැනීම :

මෙම සභාව සතු අංකඃ ජී.කේ.1483 ට්‍රැක්ටරයට බැටරියක් ලබාගැනීම සඳහා ලබාගත් මිළ ගණන් පහත දැක්වේ.

| සිටි ටයර් සර්විස් | ජයන්ති ටයර් සෙන්ටර් | රෙයින්බෝව් ටයර් සර්විස් |
|---|---|---|
| රු.13000/- | රු.12900/- | රු.13275/- |

ඉහත සඳහන් මිළ ගණන් අතුරින් " ජයන්ති ටයර් සෙන්ටර් " ආයතනයේ අවම මිළ ගණන පිළිගැනීමට සභාවේ අනුමැතිය ලබාදෙන ලදී.

09:02 VI-1833 යතුරු පැදියට ටයර් 02 ක් ලබාගැනීම

මෙම සභාවට අයත් VI-1833 යතුරු පැදියට ටයර් 02 ක් ලබාගැනීම සඳහා ලබාගත් මිළ ගණන් පහත දැක්වේ.

| සිටි ටයර් සර්විස් | ජයන්ති ටයර් සෙන්ටර් | රෙයින්බෝව් ටයර් සර්විස් |
|---|---|---|
| රු.10600/- | රු.10500/- | රු.10850/- |

ඉහත සඳහන් මිළ ගණන් අතුරින් " ජයන්ති ටයර් සෙන්ටර් " ආයතනයේ අවම මිළ පිළිගැනීමට සභාවේ අනුමැතිය ලබාදෙන ලදී.

10. **යථා පරිදි කල් දී ඇති ප්‍රශ්ණ** : නැත

11. **යෝජනා**

11:01 **ගරු උපසභාපති, ඩබ්.ඒ.වසන්ත පුෂ්පකුමාර ගුණරත්න මැතිතුමා :**

01. 2012 දිවි නැගුම වැඩ සටහන යටතේ තුඹගොඩ ග්‍රාම නිලධාරී වසම සඳහා කොම්පෝස්ට් පොහොර කිලෝ 10 ක් ලබාගැනීමට අවශ්‍ය කටයුතු කිරීම.

කිලෝ 05 කට මුදල් අයකිරීමටත්, කිලෝ 05 ක් නොමිලයේ ලබාදීමටත් සභාවේ අනුමැතිය ලබාදෙන ලදී.

11:02 **ගරු නාගරික මන්ත්‍රී, එම්.ජේ.මලික්ෂා මැතිතුමා**

01. ගොරොක්ගහමඩ බෙතල්හිල් මාවත සම්පූර්ණයෙන්ම අබලන් වී ඇති බැවින් සුදුසු ක්‍රියාමාර්ගයක් ගැනීම

i. කාණු පද්ධතිය අබලන් වී ඇත
ii. විථි ලාම්පු නඩත්තුව සම්පූර්ණයෙන්ම ඇණහිට ඇත
iii. කුණු කසල ගෙනයාමට ට්‍රැක්ටරය නොඒම නිසා ජනතාව අපහසුතාවයට පත් වී ඇත.

02. කල්තොට පාරේ මිරිස්වත්ත දක්වා ජාතික පාසල් 02 ක් ඇති අතර, එම මාර්ගය කාපට් කරන විට පාර දෙපැත්තේ පදිකයින්ට යාමට තීරු වෙන්කර නොමැත. එම නිසා ජනතාව ඉතා අපහසුතාවයට පත්ව ඇත. නැවත එම මාර්ගයේ ඇති අඩුපාඩු සම්බන්ධව මාර්ග සංවර්ධන අධිකාරිය දැනුවත් කර මගීන්ගේ ආරක්ෂාව සඳහා දෙපැත්තේ තීරු වෙන්කිරීම. ( මෙම යෝජනාව මාර්ග සංවර්ධන අධිකාරිය වෙත යොමුකිරීමට සභාවේ අනුමැතිය ලබාදෙන ලදී.)

03. ෆලීල් හජ්ජියාර් මාවත වතුර ටැංකියට යන මාර්ගය නගර සභාවට අලුතෙන් එකතු වූ මාර්ගයක් වන අතර, එම මාර්ගය සම්පූර්ණයෙන්ම පස් වලින් පිරී ඇත. එම පස් ඉවත්කර පාර අලුත්වැඩියා කිරීම.

ඉහත සඳහන් යෝජනා ගරු නාගරික මන්ත්‍රී චමික ජයම්ණ වැවේගෙදර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

11:03 **ගරු නාගරික මන්ත්‍රී, එම්.ටී.එම්.රූමි මැතිතුමා :**

01. මෙම නගර සභාවට විදුලි කම්කරු මහතෙකු අලුතින් බඳවා ගැනීම

මෙම යෝජනාව ගරු නාගරික මන්ත්‍රී, ඊ.ඒ.ජයන්ත ප්‍රේමකුමාර මැතිතුමා විසන් ස්ථිර කරන ලදී.

11:04 **ගරු නාගරික මන්ත්‍රී චමික ජයමිණ වැවේගෙදර මැතිතුමා :**

නගරයේ දැනට ක්‍රියාත්මකව පවතින රථවාහන සැලැස්ම සංශෝධනය කිරීම

- කාර්පාක් අසල සිට ජේ.එෆ්.හන්දිය දක්වා මාර්ගය
- කොමර්ෂල් බැංකුව දෙස සිට නව බස්නැවතුම්පල පිවිසුම් මාර්ගය

මෙම යෝජනා ගරු නාගරික මන්ත්‍රී , ඒ.අසංක නිල්මිණි විජේසිංහ මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

11:05 **ගරු නාගරික මන්ත්‍රී , නිමල් කරුණාරත්න මැතිතුමා :**

01. බළන්ගොඩ නව බස්නැවතුම්පොල ගුවන් පාලමේ ඔරලෝසුවක් සවිකිරීම.

ගරු උපසභාපතිතුමන් විසින් මෙම යෝජනාව ස්ථිර කරන ලදී.

## 12. ආදායම් - වියදම් වාර්තා හා අනෙකුත් වාර්තා ඉදිරිපත් කිරීම

2012 වර්ෂයේ මාර්තු මාසයට අදාළ ආදායම් හා වියදම් පිළිබඳ වාර්තාව සභාවට ඉදිරිපත් කර තිබුණි.

| | |
|---|---|
| පුනරාවර්ථන ලැබීම් | 5,042,302.53 |
| වෙනත් ලැබීම් | 2,097,264.96 |
| **මුළු ලැබීම්** | **7,139,567.49** |
| පුනරාවර්ථන වියදම් | 7,799,233.59 |
| වෙනත් වියදම් | 5,907,832.81 |
| **මුළු වියදම්** | **13,707,066.40** |

මෙම ආදායම් හා වියදම් වාර්තාව සභාව විසින් අනුමත කරන ලදී.

12:01 බළන්ගොඩ නගර සභා තානායම ආරම්භයේ සිට හා 2012.03.31 දිනට වෙළඳ හා ලාභඅලාභ ගිණුම සභාවට ඉදිරිපත් කරන ලදී.

| විස්තරය | 2012.03.01 සිට 2012.03.31 දක්වා | 2010.08.10 දින සිට 2012.03.31 දක්වා |
|---|---|---|
| විකුණුම් | 877,148.52 | 19,805,684.00 |
| **විකුණුම් පිරිවැය** | **704,252.45** | **15,364,904.60** |
| දළ ලාභය | 172,896.07 | 4,440,779.40 |
| ශුද්ධ ලාභය/අලාභය | ( 74,515.67) | 210,233.18 |

මෙම ලාභඅලාභ ගිණුම සභාව විසින් අනුමත කරන ලදී.

12:02 2011 වර්ෂය සඳහා සකස් කල මූල්‍ය ප්‍රකාශනය ඉදිරිපත් කිරීම :

- 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ආදායම් වියදම් ගිණුම
- 2011 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය
- 2011/12/31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශය සභාව විසින් අනුමත කරන ලදී.

12:03 2012-04-25 දින පැවති මුදල් ප්‍රතිපත්ති හා ප්‍රසම්පාදන කමිටු වාර්තාව සභාවට ඉදිරිපත් කරන ලද අතර, එම කමිටු වාර්තාව සභාව විසින් සම්මත කරන ලදී.

## 13. කාරක සභා වාර්තා ඉදිරිපත් කිරීම:

13:01 බළන්ගොඩ නගර සභා මහජන පුස්තකාලය සඳහා සකස් කල අතුරු ව්‍යවස්ථාවේ කෙටුම්පත සභාවේ අනුමැතිය සඳහා ඉදිරිපත් කිරීම :

බළන්ගොඩ නගර සභා මහජන පුස්තකාලයට අදාළව ඉදිරිපත් කරන ලද අතුරු ව්‍යවස්ථාවේ සඳහන් කරුණු සම්බන්ධව ගරු සභාපතිතුමන් විසින් කරුණු පැහැදිලි කිරීමක් සිදුකරන ලදී.

**නගර සභා සීමාවෙන් පිටත පදිංචි අය සඳහා සාමාජිකත්වය ලබාදීම :**

බළන්ගොඩ මැතිවරණ බල ප්‍රදේශය තුළ ස්ථිර පදිංචි අවුරුදු 14 ට වැඩි කියවීමේ හා ලිවීමේ හැකියාව ඇති ඕනෑම අයෙකුට නගර සභා සීමාව තුළ ස්ථිර පදිංචි වරිපනම් බදු ගෙවන්නකු ඇපවීමෙන් සාමාජිකත්වය ලබාගැනීමට හැකියාව ඇති අතර, අයදුම්කරුගේ පදිංචිය ඔහු පදිංචි ප්‍රදේශයේ ග්‍රාම නිලධාරී මහතා විසින් සහතික කල යුතුය.

සාමාජික ගාස්තු ලෙස කාලානුරූපව සභා සම්මුති මගින් නියම කරනු ලබන මුදල මෙන් දෙගුණයක මුදලක් සැම විටම අයකල යුතුය.

ඉහත සඳහන් සංශෝධනයන්ට යටත්ව අතුරු ව්‍යවස්ථාව අනුමත කිරීම සුදුසු බැව් ගරු නාගරික මන්ත්‍රී එම්.ටී.එම්.රූමි මැතිතුමා විසින් යෝජනා කල අතර, එම යෝජනාව ගරු නාගරික මන්ත්‍රී ධර්මසේන සමරසිංහ මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ඒ අනුව මෙම අතුරු ව්‍යවස්ථාව සභා සම්මත කරන ලද අතර, පළාත් පාලන කොමසාරිස්ගේ අනුමැතියට යැවීමට තීරණය කරන ලදී.

15. **වෙනත් කරුණු :-**

15:01 **ගරු නාගරික මන්ත්‍රී, එම්.ටී.එම්.රූමි මැතිතුමා :**

ගරු මන්ත්‍රීතුමා සභාව අමතමින්, වත්මන් එක්සත් ජනතා නිදහස් සන්ධාන රජය රට ණයට සංවර්ධනය කරන බැව් පසුගිය මහා සභා රැස්වීමේ දී ගරු නාගරික මන්ත්‍රී චමික ජයමිණි මැතිතුමා විසින් ප්‍රකාශ කර ඇති බැවින්, ඒ සම්බන්ධව යම් කරුණු පැහැදිලි කිරීමක් කල යුතු බව පැවසීය.

මෑත කාලයේ එක්සත් ජාතික පක්ෂයේ ජනාධිපති ධුරයට පත් වූ ගරු ජේ.ආර්.ජයවර්ධන මැතිතුමා හා රනිල් වික්‍රමසිංහ මැතිතුමා මේ රටේ කිසිදු සංවර්ධනයක් හෝ රැකියා අවස්ථාවන් ලබාදීමට කටයුතු නොකල බැව් පැවසීය. 1994 වර්ෂයේ දී බලයට පත් වූ එක්සත් ජනතා සංධානයේ ගරු ජනාධිපතිණි චන්ද්‍රිකා බණ්ඩාරනායක මැතිණියගේ පාලන කාලය තුළ ආර්ථික සංවර්ධන වේගය 3.4 ක් වශයෙන් පැවති අතර, එය වර්තමාන ගරු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ පාලන කාලය තුළ 7.8 ක් ලෙස ඉහල නංවා ඇති බැව් පැවසීය. වසර ගණනාවක් පැවති කුරිරු යුද්ධය නිමාකර සැම දෙනාටම සමගියෙන් සතුටින් ජීවත්වීමට හැකි පරිසරයක් නිර්මාණය කර ඇති බැව් පැවසූ එතුමා, එක්සත් ජාතික පක්ෂය මෙවර මැයි දින පෙළපාලිය පවත්වනු ලබන්නේ යාපනයේ දී බවත්, එක්සත් ජාතික පක්ෂ නායකතුමාට එම වාසනාව උදාවූයේ අතිගරු ජනාධිපතිතුමා නිසා යැයි ද පැවසීය. එසේම රට සිසු සංවර්ධන ක්‍රියාවලියකට යොමුකරමින් රැකීරක්ෂාවන් විශාල ප්‍රමාණයක් ලබාදීමටද කටයුතු කර ඇතැයි පැවසීය.

අතිගරු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ දූරදර්ශී වැඩපිළිවෙල අගය කරමින් එතුමාට සහය දැක්වීම අප සැමගේ යුතුකම බවද පැවසීය.

සබරගමුව පළාත් පාලන ආයතනවල ගරු මන්ත්‍රීවරුන්ට යතුරු පැදි ලබාගැනීම සඳහා රු.150000/- ක මුදලක් හා ඉන්ධන දීමනාව ලෙස රු.3000/- ක් ලබාදීමට අවශ්‍ය කටයුතු ඉටුකිරීම පිළිබඳව සබරගමුව පළාත් ගරු ප්‍රධාන අමාත්‍ය මහීපාල හේරත් මැතිතුමා වෙත සිය ස්තුතිය පළකරන බැව් දැන්වීය.

තවදුරටත් කථාකල ගරු මන්ත්‍රීතුමා, ඉදිරියේ දී උතුරු නැගෙනහිර හා සබරගමුව පළාත විසුරුවා හරින බැව් දැනගැනීමට ඇතැයි පැවසීය. බළන්ගොඩ සංවර්ධනයේ නියමුවා වන මෙම සභාවේ ගරු සභාපතිතුමා පළාත් සභා අපේක්ෂකයෙකු වශයෙන් ඉදිරිපත් කිරීමට යෝජනා කරන අතර, එතුමාට බළන්ගොඩ ජනතාවගේ පූර්ණ සහයෝගය හා අශිර්වාදය ලැබෙන බැව් පවසමින් ඒ සඳහා එතුමාට වාසනාව උදාවේවායි ප්‍රාර්ථනය කරන බැව් දැන්වීය.

15:02 **ගරු නාගරික මන්ත්‍රී ඒ.අසංක නිල්මිණි විජේසිංහ මැතිතුමා :**

ගරු මන්ත්‍රීතුමා කථාකරමින්, කරදියමුල්ල මාර්ගයේ සුසාන භූමිය දක්වා මාර්ගය කිසිදු නඩත්තු කිරීමක් නොමැති බවත්, එම නිසා එම මාර්ගය පිළිසකර කරදෙන ලෙස ඉල්ලා සිටින ලදී.

අතිගරු ජනාධිපතිතුමා පසුගිය දා බළන්ගොඩ ආනන්ද මෛත්‍රීය මහා විද්‍යාලයේ පරිපාලන ගොඩනැගිල්ල විවෘත කිරීම හා අභිමන් මාතාවන්ට සම්මාන ප්‍රදානය කිරීමේ උත්සවයට පැමිණි බැව් පැවසීය. එතුමාගේ මෙම ඓතිහාසික පැමිණීම සම්බන්ධව සතුට පළකරන බැව් පැවසූ ගරු මන්ත්‍රීතුමා , අභිමන් මාතා උත්සවය ක්‍රමවත්ව සංවිධානය නොකිරීම නිසා සම්මාන ලබාගැනීමට පැමිණි මව්වරු සම්මාන ලබාගෙන නිවසට යාමට ප්‍රථම රෝගාතුර වී රෝහල කරා ගෙන යැමට සිදු වූ බැව් පැවසීය. මෙවැනි උත්සව සංවිධානය කිරීමේ දී මහජනතාව අපහසුතාවකට ලක්නොවන ආකාරයට අවශ්‍ය පහසුකම් සංවිධානය කිරීම වගකිව යුත්තන්ගේ වගකීම යැයි පැවසීය. මෙම වැඩ සටහන සඳහා පළාත් සභාව රු.ලක්ෂ 87 ක පමණ මුදලක් වැයකර ඇතැයි ද පැවසීය. මහජනතාවගේ මුදල් නාස්ති නොකර ඵලදායී කාර්යයක් සඳහා යෙදවීමට ක්‍රියාකල යුතු යැයි ද පැවසීය. උදා: බළන්ගොඩ මූලික රෝහලේ දැඩි සත්කාර ඒකකයේ අඩුපාඩු රැසක් පවතින බවත්, සබරගමුව පළාත් සෞඛ්‍ය අමාත්‍යවරයා බළන්ගොඩ ප්‍රදේශයේ අයෙකු බැවින් මේ කෙරෙහි එතුමාගේ විශේෂ අවධානය යොමු කර අඩුපාඩු සකස් කිරීමට පියවර ගත්තේ නම් එය අගය කලයුතු මහා පුන්‍යකර්මයක් වන බැව් පැවසීය.

මහජනතාවගේ මුදල් මෙලෙස නාස්තු කිරීම සම්බන්ධව විපක්ෂයේ සහ බළන්ගොඩ ජනතාවගේ විරෝධය ප්‍රකාශ කරන බැව් පැවසීය.

15:03 **ගරු නාගරික මන්ත්‍රී, එම්.ජේ.මලික්ෂා මැතිතුමා :**

ගරු මන්ත්‍රීතුමා කථා කරමින්, එක්සත් ජාතික පක්ෂ පාලන කාලය තුළ ජනාධිපති ධුරයට පත් වූ ජේ.ආර්.ජයවර්ධන මැතිතුමා හා රනිල් වික්‍රමසිංහ මැතිතුමා මේ රටේ සංවර්ධනය සහ සුභසාධනය උදෙසා කිසිදු ක්‍රියාමාර්ගයක් නොගත් බැව් ගරු නාගරික මන්ත්‍රී එම්.ටී.එම්.රූමි මැතිතුමා විසින් අද දින සභාවේ දී ප්‍රකාශයක් කල බවත් ඒ සම්බන්ධව යම් අදහස් පැහැදිලි කිරීමක් කල යුතු බැව් දැන්වීය. වරින් වර බලයට පත්වන ජනාධිපතිවරුන් ඔවුන්ට හැකි අයුරින් සේවය කර ඇති බවත්, එතුමන්ලා විසින් කරනු ලැබූ සේවයන් අගය කිරීම අපගේ යුතුකම බවත්, අතිගරු ජනාධිපති ජේ.ආර්.ජයවර්ධන මැතිතුමා රටේ සුභ සාධනය උදෙසා විශාල වැඩ කොටසක් ඉටුකල බැව් පැවසීය. උදා: පාසල් දරුවන්ට නොමිළයේ පාසල් පෙළපොත් ලබාදීම, නිළ ඇඳුම් ලබාදීම ඉන් කිහිපයක් යැයි පැවසීය. වත්මන් ගරු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමා යුද්ධය නිමකර සැම දෙනාටම සහයෝගයෙන් සතුටින් ජීවත්වීමට හැකි පරිසරයක් නිර්මාණය කර ඇති බවත්, " මතට තිත " වැනි අගය කල යුතු මහජන වැඩ සටහන් රැසක් ක්‍රියාත්මක කරඇති බැව් පැවසීය. යුද්ධය නිමකර වසර 03 ක් ගත වී ඇතත් ජනතාවගේ ජීවන වියදම විශාල ලෙස ඉහල නැංවීමට රජය කටයුතු කර ඇති නිසා මහජනතාව දැඩි ආර්ථික අපහසුතා මධ්‍යයේ ජීවත්වන බැව් පැවසීය. එම නිසා විශේෂයෙන් රජය ජනතාවගේ ජීවන වියදම අඩුකිරීමට අවධානය යොමුකල යුතු බැව් වැඩි දුරටත් අදහස් දක්වමින් පැවසීය.

15:04 **ගරු නාගරික මන්ත්‍රී, ධර්මසේන සමරසිංහ මැතිතුමා :**

ගරු මන්ත්‍රීතුමා සභාව අමතමින් පසුගිය සිංහල හා හින්දු අලුත් අවුරුදු සමගේ බළන්ගොඩ නගරයේ වාහන තදබදය වලකාලමින් නගරයට පැමිණෙන පාරිභෝගිකයින්ගේ ආරක්ෂාව තහවුරු කිරීමට පියවර ගැනීම සම්බන්ධව බළන්ගොඩ පොලිස් ස්ථානයේ ස්ථානාධිපතිතුමා ඇතුළු කාර්ය මණ්ඩලයට සිය ස්තුතිය පළකරන බැව් දැන්වීය.

පසුගිය දා අතිගරු ජනාධිපතිතුමා ර/බළන්ගොඩ ආනන්ද මෛත්‍රීය මහා විද්‍යාලයට පැමිණි අවස්ථාවේ දී අභිමන් මාතාවන් අගය කරමින් සම්මාන ප්‍රදානය කිරීම සිදුකල බැව් පැවසීය. බළන්ගොඩ ප්‍රධාන සංවිධායක හා සබරගමුව පළාත් සෞඛ්‍ය දේශීය වෛද්‍ය හා වනිතා කටයුතු ගරු අමාත්‍ය භාණු මුණිප්‍රිය මැතිතුමා ඉතාමත් කැපවීමෙන් එම උත්සවයේ කටයුතු මැනවින් සංවිධානය කර තිබුණු බැව් පැවසීය. අතිවිශාල ජනතාවක් අතිගරු ජනාධිපතිතුමා දැකගැනීමට පැමිණි බවත්, එම නිසා ජනතාවට යම් යම් අපහසුතාවලට ලක්වීමට සිදු වු බැව් පැවසීය. රටේ යහපත උදෙසා යහපත් පුරවැසියන් බිහිකල මව්වරුන් අගය කරමින් සම්මාන ප්‍රදානය කිරීම ඉතා අගය කල යුතු වැඩ සටහනක් බවත්, මේ සඳහා වැය කල මුදල නාස්තියක් නොවන බවත්, මීට වඩා මුදල් නාස්තිවීම සිදුවන බැව් පැවසීය. අභිමන් මාතාවන් අගය කරමින් ආරම්භ කල මෙම වැඩ සටහනට විරෝධය ප්‍රකාශ කිරීම සම්බන්ධව ආණ්ඩු පක්ෂයේ ගරු මන්ත්‍රීවරුන් සියළු දෙනා ප්‍රතික්ෂේප කරන බැව් පැවසීය.

බළන්ගොඩ මහජන බැංකුව ඉදිරිපිට මගී ආවරණය අසල ඇති ලොතරැයි අලෙවි කුටිය ඉවත් කරදෙන ලෙස ඉල්ලා සිටින ලදී.

15:05 **ගරු උපසභාපති, ඩබ්.ඒ.වසන්ත පුෂ්පකුමාර ගුණරත්න මැතිතුමා :**

ගරු උපසභාපතිතුමා සභාව අමතමින්, අභිමන් මාතා වැඩ සටහන ජාතික වැඩ සටහනක් ලෙස ක්‍රියාවට නැංවීමට රජය මේවනවිට අවශ්‍ය කටයුතු සුදානම්කර ඇති බැව් දැනගැනීමට ඇතැයි පැවසීය. සුගිය දා බළන්ගොඩ ආනන්ද මෛත්‍රීය ජාතික පාසලේ පරිපාලන ගොඩනැගිල්ල විවෘත කිරීම හා අභිමන් මාතාවන්ට සම්මාන ප්‍රදානය කිරීමට පැමිණි බැව් පැවසීය. අතිගරු ජනාධිපතිතුමන් ජනාධිපතිධුරයට පත් වු පසුව බළන්ගොඩට පැමිණි පළමු අවස්ථාව මෙය බවත්, එතුමා දැක බලාගැනීමට අතිවිශාල ජනතාවක් එම උත්සවයට සහභාගී වු බැව් පැවසීය. මෙම උත්සවය ඉතා ක්‍රමවත් පැවැත්වීමට සබරගමුව පළාත් ගරු සෞඛ්‍ය දේශීය වෛද්‍ය හා වනිතා කටයුතු අමාත්‍ය භාණු මුණිප්‍රිය මැතිතුමා කටයුතු කර තිබුණ බැව් පැවසීය. විශාල පිරිසක් පැමිණීම නිසා යම් යම් අයට අපහසුතාවලට ලක්වීමට සිදු වු බැව් පැවසීය. මෙය උත්සවය සංවිධානය කිරීමේ වරදක් නොවන බවත්, බලාපොරොත්තු නොවු විශාල සංඛ්‍යාවක් පැමිණීම නිසා සිදු වු අපහසුතාවයක් යැයි පැවසීය. අභිමන් මාතා වැඩ සටහනට මුදල් වැය කිරීම මුදල් නාස්තියක් නොවන බවත්, ප්‍රතිපක්ෂය විසින් මේ සම්බන්ධව කරනු ලැබු ප්‍රකාශය ප්‍රතික්ෂේප කරන බවත් පැවසීය.

නව වරිපනම් තක්සේරුවට අදාළව කැඳ වු විරෝධතා පරීක්ෂණයට විරෝධතා ඉදිරිපත් කිරීමට විශාල ජනතාවක් පැමිණි බවත්, ඇතැම් අයගේ දැනට තිබෙන තක්සේරු මුදලට වඩා වැඩි මුදල විරෝධතා පරික්ෂණයේ දී වැඩිවිය හැකි බැව් එම නිලධාරීන් විසින් පැවසු නිසා ඇතැම් අය පරීක්ෂණයට ඉදිරිපත් නොවී ආපසු ගිය බැව් පැවසීය. නමුත් ඇතැම් අයගේ 10% 20% වශයෙන් මුදල් අඩුකිරීමක් සිදුකර ඇති බැව් පැවසීය. එම නිසා ඇතැම් අයට අසාධාරණයක් සිදු වු බවත්, එම නිසා නැවත විරෝධතා පරීක්ෂණයක් පවත්වන විට සියළු දෙනාම දැනුවත් කර අදාල විරෝධතා පරීක්ෂණ වලට යොමු කිරීමට කටයුතු කරන ලෙස ඉල්ලීමක් කරන ලදී.

සුදර්ශනපුර මාර්ගය ඉතා අබලන් එය සකස් කරදෙන ලෙස ඉල්ලීමක් කරන ලදී.

16. **අවසානය :**

**ගරු සභාපති, ඩබ්.එම්.එන්.ජී.වීරසිංහ මැතිතුමා :**

අද දින සභාවේ වැඩ කටයුතු සාර්ථක කරගැනීම සඳහා සහයෝගය ලබාදුන් ගරු උපසභාපතිතුමා ඇතුළු ගරු මන්ත්‍රීවරුන්ට සිය ස්තුතිය පළකරමින් සභාවේ වැඩ කටයුතු ප.ව.12.30 ට පමණ අවසන් කරන ලදී.

ඩබ්.එම්.එන්.ජී.වීරසිංහ,
සභාපති,
බළන්ගොඩ නගර සභාව.